# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 29 දරන
# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 04 වන දින]

එල්. ඩී.—ඕ. 16/97.

**දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඩු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දණ්ඩ නීති සංග්‍රහයේ 286අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **19 වන පරිච්ඡේදයේ 286අ වගන්තිය සංශෝධනය කිරීම.**

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය එම වගන්තියේ (4) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) විකාශනය සඳහා තමාට භාර දෙන ලද යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් ළමයකුගේ අසභ්‍ය හෝ අශ්ලීල ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් බව, ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන යම් තැනැත්තකු විසින් සොයා ගනු ලැබීමේදී, ඒ තැනැත්තා විසින් නොපමාව ම ඔහුගේ සන්තකයේ එම ඡායාරූපය හෝ චිත්‍රපටය තිබෙන බව ළඟම පොලිස් ස්ථානය භාර නිලධරයාට දැන්විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන කවර හෝ තැනැත්තෙක් අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමකින් හෝ දඩයකින් හෝ ඒ දෙකෙන් ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.".

3. පහත දැක්වෙන අලුත් වගන්ති 287 වන වගන්තියට ඉක්බිතිව ම, මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 288, 288අ සහ 288ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 288, 288අ සහ 288ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

2—D 048904—12,900 (98/04)

"ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම.

'288. (1) සිඟාකෑමේ හෝ දන් ලැබීමේ හෝ දන්දීමට පෙළඹවීමේ කාර්යය සඳහා (යම් සිංදු කීමේ, ක්‍රීඩා කිරීමේ, රංගනයේ යෙදීමේ, යම් දෙයක් විකිණීමට ඉදිරිපත් කිරීමේ හෝ වෙනත් ආකාරයක ව්‍යාජයක් ඇතත් නැතත්) යම් වීදියක, ස්ථානයක හෝ තැනක සිටීමට ළමයකුට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකට ද යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ "ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම.

288අ. (1) නීති විරෝධී ලිංගික සංසර්ගය සඳහා යම් තැනැත්තකු කුට්ටනය කිරීමට දැන දැනම ළමයකු කුලියට ගන්නා, සේවයේ යොදවන, කැමති කරවා ගනු ලබන, යොදවන, පොළඹවන හෝ එම ළමයාට බලකරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකට ද යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ "ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම.

288ආ. (1) යම් සීමිත භාණ්ඩයක් ජාවාරම් කිරීමට දැනදැනම ළමයකු කුලියට ගන්නා, සේවයේ යොදවා ගන්නා, කැමති කරවා ගන්නා, පොළඹවන, යොදවන හෝ එම ළමයාට බලකරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකට ද යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ—

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙක් අදහස් වේ ;

"සීමිත භාණ්ඩය" යන්නට (218 වන අධිකාරය වන) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතින් එයට දී ඇති අර්ථය ම ඇත ;

"ජාවාරම් කිරීම" යන්නට විකිණීම, දීම, කුට්ටනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, යැවීම, භාරදීම හෝ බෙදා හැරීම ඇතුළත් වේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 302 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 302 වන වගන්තිය ඉවත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 360අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 360අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (5) වන උපවගන්තියේ ආරම්භයේ සිට "සුපුරුදු වාසස්ථානය" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත නීති විරෝධී ලිංගික සංසර්ගය පැවැත්වීමේ අදහසින් ශ්‍රී ලංකාවේ ඒ තැනැත්තාගේ සුපුරුදු වාසස්ථානය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (6) වන උපවගන්තියේ "ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ගණිකා නිවාසයක රඳවා තබා ගන්නා" යන වචන වෙනුවට "ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ස්ථානයක රඳවා තබා ගන්නා" යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 363 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 363 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ රඳවා ගැනීමේ තර්ජනයෙන් හෝ ඇයට මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඇය නීත්‍යානුකූල හෝ නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටිය දී හෝ ඇයගේ කැමැත්ත ලබා ගෙන ඇති අවස්ථාවක, ඇගේ කැමැත්ත ඇතිව ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) අනෙක් තැනැත්තා වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු වූ විට ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව ; සහ

(2) එම වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) ඒ අනෙක් තැනැත්තා නීත්‍යානුකූල හෝ නීතිවිරෝධී ලෙස රඳවාගෙන සිටිය දී බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ රඳවා ගැනීමේ තර්ජනයෙන් හෝ ඒ අනෙක් තැනැත්තාට මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඒ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ලබාගෙන ඇති අවස්ථාවක එසේ ලබා ගත් කැමැත්ත ඇතිව ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.